ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

15

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/9/11

2018 මැයි මස 23 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාවෙන් පාලනය වන සියළුම නිලධාරීන් සඳහා
රු. 50,000.00 ක විශ්‍රාම වැටුප් හිමිකම් සහිත දීමනාවක් ලබා දීම

ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාවෙන් පාලනය වන සියළුම නිලධාරීන්ගේ රාජකාරි විෂයපථය තුළ බහු විධ කාර්යභාරයන් මෙන්ම ඉහළ වගකීම් දැරීමක් ඇතුළත් වුවද, ඔවුන්ගේ වැටුප් ඊට සරිලන මට්ටමක නොමැති බව අවධානයට යොමු කරමින්, එම සියළුම නිලධාරීන් සඳහා රු. 50,000.00 ක විශ්‍රාම වැටුප් හිමිකම් සහිත දීමනාවක් ලබා දීමට අතිගරු ජනාධිපතිතුමා විසින් අංක : පීඑස්/සීපී/16/2018 හා 2018.04.12 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශය සම්බන්ධයෙන් අංක : 18/0785/701/019 හා 2018.05.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.

තවද, ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සම්බන්ධයෙන් වූ අංක 1992/23 හා 2016.11.09 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයෙන් සංශෝධිත, අංක 48/2 හා 1979.08.06 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත පහත තනතුරුධාරීන් උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මත මෙම දීමනාවට හිමිකම් ලබයි.

- ජනාධිපති ලේකම්
- අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
- අග්‍රාමාත්‍ය ලේකම්
- අමාත්‍යාංශ ලේකම්වරුන්
- ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී
- ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරුන්

ඒ අනුව,

(1) උක්ත තනතුරුධාරීන් සඳහා පමණක් 1999.01.21 දිනැති රා.ප.ච.ලේ. අංක 01/1999 මගින් ගෙවනු ලබන රු. 15,000.00 ක මාසික දීමනාව, තවත් රු. 35,000.00 කින් වැඩිකොට, රු. 50,000.00 ක විශ්‍රාම වැටුප් සහිත දීමනාවක් ලබා දෙනු ලැබේ.

(2) මෙම තීරණය 2018.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

ගාලු මුවදොර, කොළඹ 01 | காலி முகத்திடல், கொழும்பு 01 | Galle Face, Colombo 01
දුරකථන | தொலைபேசி | Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් | தொலைநகல் | Fax: ++ 94 11 2446657
ඊ-තැපැල | மின்-அஞ்சல் | e-mail: prsec@presidentsoffice.lk

(3) අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, මෙම දීමනාව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුර සඳහා ද අදාළ කර ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරනු ඇත.

තවද, අංක 01/1999 හා 1999.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ගෙවනු ලබන රු. 15,000.00 ක දීමනාව මේ වන විට ලබා ගනු ලබන අනිකුත් කිසිදු තනතුරුධාරියෙකු මෙම දීමනාව සඳහා හිමිකම් නොලබන අතර, හුදෙක් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාවෙන් ආවරණය වන නිලධාරීන් සඳහා පමණක් මෙම චක්‍රලේඛ විධිවිධාන බලපැවැත්වේ.

ඔස්ටින් ප්‍රනාන්දු
ජනාධිපති ලේකම්

පිටපත :

1. ලේකම්
   මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය } ලිපියේ අංක (3) කෙරෙහි කරු. අවධානය විශේෂයෙන් යොමු කරමි.
2. විගණකාධිපති
3. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්